# 6 ශ්‍රේණිය - බුද්ධ ධර්මය - පැවරුම 1

## I පත්‍රය

- *සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.*
- *දී ඇති පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.*

---

1. සිදුහත් කුමරු මව්කුස පිළිසිඳ ගත්තේ,
   - I. දුරුතු පොහොයදා ය
   - II. වෙසක් පොහොයදා ය
   - III. පොසොන් පොහොයදා ය
   - IV. ඇසළ පොහොයදා ය

2. බෝසත් කුමරු ඉපදුනේ,
   - I. ඇසළ පොහොයදා ය
   - II. වෙසක් පොහොයදා ය
   - III. පොසොන් පොහොයදා ය
   - IV. නවම් පොහොයදා ය

3. කුමරුන්ට නම් තැබීමේ මංගල්‍යයට පැමිණි පඬිවරුන් ගණන,
   - I. 107
   - II. 108
   - III. 100
   - IV. 110

4. කුමරු සී සෑමේ උත්සවය දින වඩන ලද භාවනාව වන්නේ,
   - I. මෛත්‍රී භාවනාව
   - II. බුද්ධානුස්සති භාවනාව
   - III. ධම්මානුස්සති භාවනාව
   - IV. ආනාපානසති භාවනාව

5. සිදුහත් කුමරුගේ ගුරුවරයා වූයේ,
   - I. කොණ්ඩඤ්ඤ බමුණා
   - II. සර්වමිත්‍ර බමුණා
   - III. රාම තවුසා
   - IV. අසිත තවුසා

6. සිදුහත් කුමරුට පැවිදිවීමට සිවුරු පිරිකර පූජා කළේ,
   - I. සහම්පති මහා බ්‍රහ්මයා
   - II. ඝටීකාර මහා බ්‍රහ්මයා
   - III. සර්වමිත්‍ර බමුණා
   - IV. සොත්ථිය බමුණා

7. බෝසතාණන් වහන්සේට කිරිපිඬු පූජා කළේ,
   - I. සුජාතා සිටු දේවිය
   - II. කිසාගෝතමිය
   - III. රජගහ නුවර සිටු දේවිය
   - IV. සැවැත් නුවර සිටු දේවිය

8. බුදුන් වහන්සේ දැක නරසීහ ගාථා කීවේ කවුද?
   - I. යසෝදරා දේවිය
   - II. කිසාගෝතමී
   - III. පටාචාරාව
   - IV. නන්ද මාතාව

9. බෝසතාණන් වහන්සේට කුසතණ පූජා කළේ,
   - I. ඝටීකාර බ්‍රහ්මයා
   - II. සහම්පති බ්‍රහ්මයා
   - III. උපක ආජීවක
   - IV. සොත්ථිය බමුණා

10. විහාරස්ථානයට ගොස් වන්දනා කරන අනුපිළිවෙළ වන්නේ,
   I. වෙහෙර වහන්සේ, පිළිම වහන්සේ, බෝධීන් වහන්සේ
   II. වෙහෙර වහන්සේ, බෝධීන් වහන්සේ, පිළිම වහන්සේ
   III. පිළිම වහන්සේ, වෙහෙර වහන්සේ, බෝධීන් වහන්සේ
   IV. බෝධීන් වහන්සේ, පිළිම වහන්සේ, වෙහෙර වහන්සේ

11. බුදුන් වහන්සේ රාහුල කුමරුන්ව පැවිදි කරන්න යැයි කීවේ,
   I. අනුරුද්ධ තෙරුන්ට  II. සැරියුත් තෙරුන්ට
   III. මහාකාශ්‍යප තෙරුන්ට  IV. මුගලන් තෙරුන්ට

12. සුද්ධෝදන රජතුමාගේ ගුරුවරයා වූයේ,
   I. වප්ප තවුසා ය  II. සර්වමිත්‍ර බමුණා ය
   III. කොණ්ඩඤ්ඤ බමුණා ය  IV. අසිත තවුසා ය

13. කුමරු දැක නිබ්බුත පද ප්‍රකාශ කළේ,
   I. කිසා ගෝතමිය  II. යසෝදරා දේවිය
   III. ප්‍රජාපතී ගෝතමිය  IV. මල්ලිකා දේවිය

14. සිදුහත් බෝසතාණන් වහන්සේට මවුලොව උපදින්නට ආරාධනා කළේ,
   I. අසිත තවුසා  II. සතරවරම් දෙවිවරු
   III. සහම්පති මහා බ්‍රහ්මයා ප්‍රමුඛ දෙවියන්  IV. සුද්ධෝදන රජු

15. බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත්වූයේ වයස අවුරුදු,
   I. 35 දී  II. 29 දී
   III. 45 දී  IV. 28 දී

16. රාහුල හිමි රහත් වූයේ,
   I. අම්බලට්ඨිකා රාහුලෝවාද සූත්‍රය අසා  II. චුල්ල රාහුලෝවාද සූත්‍රය අසා
   III. ආදිත්ත පරියාය සූත්‍රය අසා  IV. වේදනා පරිග්ගත සූත්‍රය අසා

17. මේ වැලි ප්‍රේතේ වැලිකැට ගණනට මට අවවාද ලැබේවායි ප්‍රාර්ථනා කළේ,
   I. උපාලි තෙරුන්  II. නන්ද තෙරුන්
   III. ආනන්ද තෙරුන්  IV. රාහුල තෙරුන්

18. දියුණුවේ දෙරටු පිළිබඳව දැක්වෙන ජාතක කතාව වන්නේ,
   I. සාම ජාතකය  II. සාලිකේදර ජාතකය
   III. අත්ථස්සද්වාර ජාතකය  IV. කුස ජාතකය

19. "ධම්මානුවත්තී" යනු,
   I. දැහැමිව ජීවත්වීමයි  II. ශීලාචාරකමයි
   III. කම්මැලි නැතිකමයි  IV. බහුශ්‍රැතකමයි

20. රාහුල තෙරුන්ට ලැබුණු අග තනතුර වූයේ,
   I. ධර්මධර භික්ෂූන් අතර අග තනතුර
   II. නීරෝගී භික්ෂූන් අතර අග තනතුර
   III. ශික්ෂාකාමී භික්ෂූන් අතර අග තනතුර
   IV. විනයධර භික්ෂූන් අතර අග තනතුර

# II පත්‍රය

❖ *ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.*

---

01.

I. බුද්ධ කෝලාහලය යනු කුමක්දැයි ලියන්න.
II. සතර පෙරනිමිති නම් කරන්න.
III. සිදුහත් කුමරුන්ට පියරජුගේ දෙවන වැඳුම සිදුවූයේ කුමන අවස්ථාවකදීද?
IV. සිදුහත් බෝසතාණන් වහන්සේ අවසන් භවයේ සිටියේ කුමන ස්ථානයකද?
V. ශාසනික වචන හතර් ලියා එහි තේරුම ද ලියන්න.

02.

I. මහාමායා දේවිය කලුරිය කළේ කුමරු ඉපදී කොපමණ දිනකින්ද?
II. සිදුහත් කුමරු උපන් අවස්ථාවේ සිදුවූ අසිරිමත් සිදුවීම් 3 ක් ලියන්න.
III. සිදුහත් කුමාර චරිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ 5 ක් ලියන්න.

03.

I. මෛත්‍රිය යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි ලියන්න.
II. මෙත් වඩන අයුරු පියවර වශයෙන් කෙටියෙන් ලියන්න.
III. මෛත්‍රී භාවනාව වැඩීමේ අනුසස් 05 ක් ලියන්න.

04.

I. පන්සලට යනවිට ගෙන යා යුතු පූජා භාණ්ඩ 3 ක් ලියන්න.
II. මල් පූජා කරන ගාථාව නිවැරදිව ලියන්න.
III. විහාරස්ථානයේදී සිදුකරනු ලබන වතාවත් 5 ක් ලියන්න.

05.

I. රාහුල කුමරුන්ට බුදුන් වහන්සේගෙන් ලැබුණ දයාදය කුමක්ද?
II. ජල බඳුන උපමා කරගෙන දේශනා කරන ලද දහම් කරුණු 3 ක් ලියන්න.
III. රාහුල තෙරුන්ගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ 5 ක් ලියන්න.